රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 366

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
1987 මැයි මස 5 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

1980 ජූලි මස තනතුර අත්හැර ගිය නිලධාරීන්/සේවකයින්

1980 ජූලි මාසයේ දී සිය තනතුරු අත්හැර ගිය රජයේ සේවයේ නිලධාරීන්/සංස්ථා සේවකයින් සම්බන්ධයෙන් මෙහි පහත දක්වා ඇති පරිදි කටයුතු කිරීමට රජය තීරණය කර ඇත.

02. තැවත සේවයේ පිහිටුවීමට සුදුසු වුවද, පුරප්පාඩු නොමැති බැවින් නැවත සේවයේ පිහිටුවනු නොලැබූ අය

(අ) මෙම වර්ගයට අයත් වන, සේවය අත්හැර යන විට විශ්‍රාම වැටුප් හිමිකම් තිබූ රජයේ නිලධරයෙකුට/සංස්ථා සේවකයෙකුට (එනම්, අවුරුදු 10 ක අවම සේවයක් තිබූ අයෙකුට) ඔහුගේ සේවා කාලයට වර්ෂ පහක් (5) එකතු කර විශ්‍රාම යැමට අයිතිය දෙනු ලැබේ.

(ආ) මෙම වර්ගයට අයත් වන එහෙත්, සේවය අත්හැර යනවිට විශ්‍රාම වැටුපක් ලබාගැනීමේ සුදුසුකම් නොමැති අයෙකුට, පවතින නීති යටතේ පාරිතෝෂික දීමනාවක් ගෙවිය යුතුය. මෙවැනි අයෙකුගේ සේවයට අවුරුදු තුනක් (3) එකතු කරනු ලබන අතර, එසේ වැඩි කරන ලද කාලසීමාව හෝ අවුරුදු දහය හෝ යන දෙකින් අඩු කාලසීමාවට, පාරිතෝෂික දීමනාව ගණන් බැලිය යුතුය.

03. තැවත සේවයේ පිහිටුවීමට නුසුදුසු අය

(අ) මෙම වර්ගයට අයත්වන, සේවය අත්හැර ගිය දිනට විශ්‍රාම වැටුප් ලබාගැනීමට හිමිකම් තිබූ අයෙකුට, විශ්‍රාම ගැනීමේ අයිතිවාසිකම දිය හැකි වුවද, මෙවැනි අයෙකුගේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය, සිය තනතුර අත්හැර යන විට ඔහුට තිබූ සේවා කාලය පමණක් වනු ඇත.

(ආ) මෙම වර්ගයට අයත්, එහෙත් සේවය අත්හැර යනවිට විශ්‍රාම වැටුප් ලබාගැනීමට හිමිකම් නොමැති අයෙකුට, පවතින නීති යටතේ පාරිතෝෂික දීමනාවක් ගෙවිය යුතුයි. (එනම්, එක වර්ෂයක සේවය සඳහා එක මසක වැටුප)

/.... 2

04. "නැවත සේවයේ පිහිටුවීමට සුදුසු" හා "නැවත සේවයේ පිහිටුවීමට නුසුදුසු", යන යෙදුම් පැහැදිලි කර ගැනීම සඳහා අංක. අමප/410/80 හා 1980.12.03 දින දරන අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන්ට යවන ලද, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද උපදෙස් මාලාව බලන්න.

05. (I) ගෙවිය යුතු විට විශ්‍රාම වැටුප් ගණන් බැලීම 1984.12.31 දිනට පෙර පැවති පදනම මත විය යුතුය.

(II) විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබා ඇති අයෙකුට පරිවර්තිත විශ්‍රාම වැටුප හිමිවේ.

(III) පවත්නා පරිපාටිය යටතේ සේවය අත්හැර ගිය දැනටමත් විශ්‍රාම වැටුප් ලබන්නාවූ අයෙකුට, ඉහත සඳහන් පරිපාටිය වඩා වාසිදායක වන්නේ නම් ඒ අනුව විශ්‍රාම වැටුප නැවත සකස් කරගත හැකි වනු ඇත.

(IV) සේවය අත්හැර ගිය දිනට තම තනතුරෙහි ස්ථිර කර නොසිටි අයෙකුට විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනාවක්, හෝ ලබාගැනීමට හිමිකම් නැත.

(V) රාජ්‍ය සංස්ථා සහ වෙනත් ආයතනවල සේවය කළ අය සම්බන්ධව, අදාල ආයතන තම තමන්ගේ පරිපාටි සකස් කර ගත යුතුය. එසේ වුවද, විශ්‍රාම වැටුප/පාරිතෝෂික දීමනාව ගෙවීම සඳහා ඉහත සඳහන් පරිපාටියම ඔවුන්ද අනුගමනය කරන්නේ නම් යෝග්‍ය වනු ඇත.

06. මෙම චක්‍රලේඛයේ විධිවිධාන යටතේ ගෙවිය යුතු වනු විශ්‍රාම වැටුප 1987 අප්‍රේල් 01 දින සිට ගෙවිය යුතුයි.

07. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අවශ්‍ය පරිදි සංශෝධනය කෙරෙනු ඇත.

Siriwardhana

ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.